# THE SRI LANKA COLLEGE OF ONCOLOGISTS

National Cancer Institute, Maharagama, Sri Lanka.

☎+94-11-2745474 ✉info@slco.lk www.slco.lk



**President**
Dr. Umagowry Saravanamuttu

**President-Elect:**
Dr. Sanath Wanigasooriya

**Vice President:**
Dr. Thushari Hapuarachichi

**Secretary**
Dr. Buddhika Somawardana

**Assistant Secretary:**
Dr. Devinda Jayathilake

**Treasurer**
Dr. Pradeep Siriwardane

**Assistant Treasurer:**
Dr. Iqbal Ahamad

**Co- Editors**
Dr. Sanjeeva Gunasekera
Dr. T Skandarajah

**Public Relations officer:**
Dr. Prabani Maddumarachchi

**Immediate Past President:**
Dr. Prasad Abeysinghe

**Past Presidents:**
Dr. N Jeyakumaran
Dr. A J Hilmi
Dr. Kanthi Perera
Dr. Dehan Gunasekera
Dr. Yasantha Ariyaratne

**Council Members:**
Dr. Lakshan Abeynaike
Dr. Mahalingam Chenthuran
Dr. Nuradh Joseph
Dr. Kavitha Indranath
Dr. Hasanthi Jayalath
Dr. Jaliya Jayasekera
Dr. Chintana Hapuarachchige
Dr. Mahendra Somathilaka
Dr. Sujeeva Weerasinghe
Dr. Mahilal Wijekoon
Dr. Kusal de Silva
Dr. Wasantha Rathnayake
Dr. N Yoganathan
Dr. Sujeewa Siyambalapitiya
Dr. Sasikala Paramakulasingam
Dr. Roshan Gunarathne
Dr. Leela Siriwardhana


02/02/2024

**මාධ්‍ය නිවේදනය**

## ලෝක පිළිකා දිනය - 2024 පෙබරවාරි 4

සෑම වසරකම පෙබරවාරි 4, ලෝක පිළිකා දිනය ලෙස සැළකේ. මෙවැනි දිනයක් ප්‍රකාශ කිරීමේ මුඛ්‍ය අරමුණ වනුයේ, දිනෙන් දින ඉහළ යන පිළිකා අවදානම හමුවේ, පිළිකාව වළක්වා ගැනීම, මුල් අවස්ථාවේදී හඳුනා ගැනීම සහ නිසි ප්‍රතිකාර ලබාදීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමයි. වසර 2008 ලෝක පිළිකා ප්‍රකාශයේ සඳහන් මූලික පරමාර්ථ මුදුන්පත් කර ගැනීම  පෙරදැරි කරගනිමින්, පිළිකා මර්දනය පිළිබඳ ජාත්‍යන්තර එකමුතුව (The Union for International Cancer Control) විසින් ලෝක පිළිකා දිනය සැමරීමෙහිලා ප්‍රධානත්වය ගනු ලබයි.

ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් ගොනු කර ඇති නවතම දත්ත අනුව, 2021 වසරේදී පමණක් ශ්‍රී ලංකාව තුළ අළුතින් වාර්ථා වූ පිළිකා රෝගීන් සංඛ්‍යාව 37,753 කි. වඩාත් සරළව කිවහොත්, සෑම දිනකම දළ වශයෙන් අළුත් පිළිකා රෝගීන් 106ක් රට තුළ රෝග විනිශ්වයට ලක් වේ. මෙම වසර තුළ පමණක් දරුවන් 1000කට වඩා වැඩි සංඛ්‍යාවක් පිළිකා රෝගයට ගොදුරු වී තිබේ. ශ්‍රී ලංකාවේ පිරිමින් අතර සුලභතම පිළිකා ලෙස වාර්ථා වන්නේ, පිළිවෙලින්, මුඛය, පෙණහළු, බඩවැල් හා ගුද මාර්ගය, ගල නාලය සහ පුරස්ථි ග්‍රන්ථිය ආශ්‍රිත පිළිකාවන්ය. එමෙන්ම කාන්තාවන් අතර සුලභතම වන්නේ, පිළිවෙලින්, පියයුරු, තයිරොයිඩ් ග්‍රන්ථිය, බඩවැල් හා ගුද මාර්ගය, ඩිම්බ කෝෂ සහ ගැබ් ගෙල ආශ්‍රිත පිළිකාවන්ය. පිළිකා රෝගයට ගොදුරු වන කාන්තාවන් අතරින් හතරෙන් එකක්ම ගොදුරු වන්නේ පියයුරු පිළිකාවන් වලට වීම විශේෂයෙන් සඳහන් කළ යුතුය.

නවතම පර්යේෂණ වලට අනුව, ලෝකය පුරා වයස අවුරුදු 50ට අඩු පුද්ගලයින් අතර අළුතින් වාර්ථා වන පිළිකා ප්‍රමාණය පසුගිය දශක තුනක කාලය තුළ 80%කින් පමණ වැඩිවී ඇති බව අනාවරණය වේ. මේ කාලය තුළ, වයස අවුරුදු 50ට අඩු අය අතර පිළිකා හේතුවෙන් සිදුවූ මරණ සංඛ්‍යාවද 27%කින් ඉහළ ගොස් තිබේ. මේ අනුව වසරකට පිළිකාව නිසා ලොවට අහිමිව යන වයස 50ට අඩු මිනිස් ජීවිත ගණන ලක්ෂ දහයකට අධිකය.

2020 වර්ෂයේදී, ශ්‍රී ලංකාවේ රෝහල් තුළ සිදුවූ මරණ සඳහා හේතුවූ දෙවැනි සුලහතම සාධකය ලෙස පිළිකා රෝගය හඳුනා ගැනුණි. 2019 වසරේදී පමණක් රෝගීන් 16,000ක් පිළිකා රෝගය නිසා ජීවිතක්ෂයට පත්ව තිබේ. ලෝකය පුරා සිදුවන සෑම මරණ 6කටම එකක් සිදුවන්නේ පිළිකා රෝගය නිසාවෙනි. දළ වශයෙන් ගත් කළ, පිළිකා මරණ වලින් තුනෙන් එකක්ම සිදු වීමට හේතු ලෙස, දුම්වැටි හා මත්පැන් පානය කිරීම, අධික තරබාරුකම, ප්‍රමාණවත් ලෙස එළවළු සහ පළතුරු ආහාරයට එක්කර නොගැනීම සහ ව්‍යායාම අඩුකම දැක්විය හැකිය.

පිළිකා සහ ඒ සඳහා වන නිසි ප්‍රතිකාර සම්බන්ධයෙන් ජනතාව අතර පවතින විවිධ දුර්මත සහ අනවබෝධය නිසා, නිසි පර්යේෂණ වලින් තහවුරු නොකළ, සුදුසුකම් නොලත් නානාවිධ ප්‍රතිකාර ක්‍රම වලට රෝගී ජනතාව රැවටීමෙන් සිදුවන්නේ, සුව කළ හැකි අවධියේදී නිසි ප්‍රතිකාර ලබාගැනීමෙන් මුලිනුපුටා දැමිය හැකිව තිබූ පිළිකාව, ශරීරය පුරා උඩු දිවීමෙන් පසුව සුව කර ගත නොහැකි අවස්ථාවේදී නිසි ප්‍රතිකාර කෙරෙහි යොමුවීමයි. පිළිකා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සැදුම්ලත් ප්‍රධානතම සංවිධානය ලෙස ශ්‍රී ලංකා පිළිකා විශේෂඥ වෛද්‍යවරුන්ගේ ශාස්ත්‍රාලය (The Sri Lanka College of Oncologists), සෑම විටකම පිළිකාව වළක්වා ගැනීම, මුල් අවස්ථාවෙදීම හඳුනා ගැනීම සහ නිසි ප්‍රතිකාර කෙරෙහි යොමු වීම සඳහා ජනතාව පෙළ ගැස්වීම තුළින් පිළිකා ප්‍රතිකාරවල අවසන් ප්‍රථිඵලය වඩාත් සාර්ථක කර ගත හැකි බව අවධාරණය කරයි.

# THE SRI LANKA COLLEGE OF ONCOLOGISTS

National Cancer Institute, Maharagama, Sri Lanka.

☎+94-11-2745474 ✉info@slco.lk www.slco.lk



**President**
Dr. Umagowry Saravanamuttu

**President-Elect:**
Dr. Sanath Wanigasooriya

**Vice President:**
Dr. Thushari Hapuarachichi

**Secretary**
Dr. Buddhika Somawardana

**Assistant Secretary:**
Dr. Devinda Jayathilake

**Treasurer**
Dr. Pradeep Siriwardane

**Assistant Treasurer:**
Dr. Iqbal Ahamad

**Co- Editors**
Dr. Sanjeeva Gunasekera
Dr. T Skandarajah

**Public Relations officer:**
Dr. Prabani Maddumarachchi

**Immediate Past President:**
Dr. Prasad Abeysinghe

**Past Presidents:**
Dr. N Jeyakumaran
Dr. A J Hilmi
Dr. Kanthi Perera
Dr. Dehan Gunasekera
Dr. Yasantha Ariyaratne

**Council Members:**
Dr. Lakshan Abeynaike
Dr. Mahalingam Chenthuran
Dr. Nuradh Joseph
Dr. Kavitha Indranath
Dr. Hasanthi Jayalath
Dr. Jaliya Jayasekera
Dr. Chintana Hapuarachchige
Dr. Mahendra Somathilaka
Dr. Sujeeva Weerasinghe
Dr. Mahilal Wijekoon
Dr. Kusal de Silva
Dr. Wasantha Rathnayake
Dr. N Yoganathan
Dr. Sujeewa Siyambalapitiya
Dr. Sasikala Paramakulasingam
Dr. Roshan Gunarathne
Dr. Leela Siriwardhana


විද්‍යාත්මක පර්යේෂණවල දියුණුව තුළින් පිළිකා ප්‍රතිකාර නිරන්තරයෙන් වඩ වඩාත් උසස් හා නවීකරණයන්ට ලක් වුවත්, මෙම ප්‍රතිකාර සඳහා දැරිය යුතු පිරිවැයද වේගයෙන් වර්ධනය වෙමින් පවතියි. පවතින විවිධ බාධක සහ සීමිත සම්පත් හමුවේ වුවද ශ්‍රී ලංකාවේ රජයේ රෝහල් දාමය මගින් පිළිකා රෝගීන්ට උපරිම ගුණාත්මක සේවයක් නොමිලයේ ලබාදීමට සෑම විටම යත්න දරයි. මේ හේතුවෙන් කලාපයේ අනෙකුත් රටවල් සමග සසඳන කළ, ශ්‍රී ලංකාවේ පිළිකා ප්‍රතිකාරයේ සහ සත්කාරයේ ප්‍රතිඵල ඉහළ මට්ටමක පවතියි. දිනෙන් දින වේගයෙන් ඉහළ යන ඖෂධ මිල ගණන් හමුවේ මෙම ප්‍රමිතීන් ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යාම අතිශයින් අභියෝගාත්මක බව නොරහසකි. රාජ්‍ය අංශයේ රෝහල්වල පවතින මූල්‍ය අඩුලුහුඩුකම් පුරවාලීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයෙහිම හවුලක් ඇතිවිය යුතුය.

ශ්‍රී ලාංකික ජනතාව නිරන්තරයෙන්ම දිවයින පුරා ඇති විවිධ පිළිකා ඒකක සඳහා නන් අයුරින් දක්වන සහයෝගය ස්තුතිපූර්වකව සිහිපත් කරමු. මහරගම ජාතික පිළිකායතනයේත්, කරාපිටිය සහ මඩකලපුව ශික්ෂණ රෝහල්වලත්, මාතර මහ රෝහලේත් මෑතකදී ගොඩ නැගූ සහ තවමත් ගොඩ නගමින් පවතින යටිතල පහසුකම් රැසක් ශ්‍රී ලාංකිකයින්ගේ ඉමහත්වූ ත්‍යාගශීලීත්වයට ජීවමාන නිදසුන් සපයයි. ශ්‍රී ලංකා පිළිකා විශේෂඥ වෛද්‍යවරුන්ගේ ශාස්ත්‍රාලය ලෙස අපි සෑම විටම මහ ජනතාවගේ නොමසුරු දායකත්වය වඩාත් අර්ථ පූර්ණ හා සංවිධිතව මෙන්ම විනිවිද භාවයෙන් යුතුව රටේ පිළිකා ප්‍රතිකාර වඩාත් උසස් මට්ටමකට නැංවීමේ අරමුණින් පෙළගැස්වීම උදෙසා ඇප කැපවී සිටිමු.

2024 වසරේ, ලෝක පිළිකා දිනය සමරණ මේ අවස්ථාවේදී, ශ්‍රී ලංකා පිළිකා වෛද්‍යවරුන්ගේ ශස්ත්‍රාලය, පිළිකා පිලිබඳ ජනතාව තුළ ඇති දැනුම හා අවබෝධය පුළුල් කිරීම උදෙසාත්, රටේ සියළු පුරවැසියන් අතර මේ කරුණු පැතිරවීම සඳහාත්, පිළිකාවෙන් ආරක්ෂා වීමට සහ වළක්වා ගැනීමට අවශ්‍ය නිසි පියවර අනුගමනය කිරීම සඳහාත්, පිළිකා රෝගයෙන් පෙළෙන අපේම සුවහසක් ආදරණීයයන්හට තම සහයෝගය සෑම විටම ලබා දීම වෙනුවෙනුත් නිරන්තරයෙන් අත්වැල් බැඳගන්න ලෙස ඔබ සියළු දෙනාගෙන් ඉල්ලා සිටියි.

ස්තූතියි!

| | |
|---|---|
| Umagowry. S. | |
| …………………………………….. | …………………………………….. |
| **සභාපති** | **ලේකම්** |
| වෛද්‍ය උමාගෞරී සරවනමුත්තු, | වෛද්‍ය බුද්ධික සෝමවර්ධන, |
| පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය, | රුධිරගත පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය |
| ශ්‍රී ලංකා ජාතික පිළිකායතනය, මහරගම | ශ්‍රී ලංකා ජාතික පිළිකායතනය, මහරගම |
| President<br>The Sri Lanka College of Oncologists<br>National Cancer Institute - Maharagama<br>Sri Lanka | Secretary<br>The Sri Lanka College of Oncologists<br>National Cancer Institute - Maharagama<br>Sri Lanka |

## For Further information contact:

| | | |
|---|---|---|
| Name | : | විශේෂඥ වෛද්‍ය බුද්ධික සෝමවර්ධන |
| Tel no | : | 0760830979 |
| Email | : | buddhikaprabath@yahoo.com |